
සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය



| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| 6 | ඉතිහාසය | 2 | 3. ලෝකයේ පැරණි ශිෂ්ටාචාර |

සැකසුම: මේස මල්හාරි

බප/හො/වීදාගම ක.වි

# ශිෂ්ටාචාර බිහිවීම

දීර්ඝ කාලයක් ගම්වල ජීවත් වූ මිනිසුන් දිනෙන් දින දියුණු වූහ.

ගොවිතැන් කිරීම



සතුන් ඇති කිරීම



සමහර ගොවීන්ට වගා කරන්නට සිදු වූයේ සාරවත් නැති වගා බිම් වලය

එම නිසා සමාජය දුප්පත් හා පොහොසත් යනුවෙන් දෙකොටසක් ඇති විය



# ධනවතුන් ඉන්පසු නගර වල ජීවත් වීමට පටන් ගත්තේය






ඒවායේ ජීවත් වන පිරිස් නාගරිකයින් ලෙස හැඳින්විණි

# ශිෂ්ටාචාරයක මූලික ලක්ෂණ

- නගරයක් ගමකට වඩා විශාල වීම
- ඔවුන් අකුරු ලිවීමට හුරුකර ගත් පිරිසකි
- නගර පාලනයට වෙනම පිරිසක් සිටියහ
- ඔවුන් ආගමික ස්ථාන ඉදිකර ගත්හ.
- දුරු රටවල් සමඟ වෙළඳ ගණුදෙනු සිදු කළහ.



# ලෝකයේ පැරණි ශිෂ්ටාචාර




- මෙසපොතේමියානු ශිෂ්ටාචාරය
- ඊජිප්තු ශිෂ්ටාචාරය
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය
- චීන ශිෂ්ටාචාරය

# මෙසපොතේමියානු ශිෂ්ටාචාරය



# හැදින්වීම







මෙම ශිෂ්ටාචාරය දියුණු වන්නේ යුප්‍රටීස් හා ටයිග්‍රීස් යන ගංගා දෙකට මැදිවය

එම ප්‍රදේශය වර්තමානයේ ඉරාකයට අයත් වේ

බිහිවූයේ ක්‍රි.පූ. 3100-2900 අතර කාලයේදීය

# කෘෂිකර්මාන්තය




ගොවිතැන හා සත්ත්ව පාලනය

වගා කරන ලද ද්‍රව්‍ය අතර ධාන්‍ය,පලතුරු හා එළවලු වර්ග විය



වගා කරන ලද ධාන්‍ය අතර තිරිඟු හා බාර්ලි ප්‍රධාන විය

# සී සෑමේ අවස්ථාවක්



ලෝහ වලින් තැනූ නගුල්
ගලින් තැනූ උදලු භාවිතා කළහ

# ආගම

## ස්වභාව ධර්මය දේවත්වයෙන් පුදනු ලැබූහ.



සුළඟ



වැස්ස



ගංවතුර

# වෙළදාම


කුඩා නැව් වලින් වෙළදාම් කිරිමට ඔවුන් දක්ෂයින් වූහ.



උතුරු කොටසේ ජීවත් වූ ඇසිරියන්වරු දක්ෂ වෙළෙන්දන් වූහ



# ඔවුන් වෙළඳාම කළේ ගොඩබිම හරහාය



තවලම





පූජකයින්

පහළ පන්ති වල වැසියන්

සමාජය

ඉහළ පන්ති වල වැසියන්

වහලුන්

# අක්ෂර පද්ධතිය



ලෝකයේ පැරණිම අක්ෂර පද්ධතිය නිපදවූයේ මොවුන්ය


මෙම අක්ෂර කූනාක්ෂර යනුවෙන් හැඳින් විය

# වෙළඳාම් කටයුතු වලට අදාළ විස්තර මැටි පුවරු වල ලියා තිබේ





ගිල්ගමේෂ් නැමැත්තා කූනාය අක්ෂරයෙන් ලියූ වීර කතාව ලොව පැරණිතම සාහිත්‍ය කෘතිය වේ.




**හමුරාබි නම් පාලකයා විසින් ලියන ලද පැරණිතම නීති පොත**

# ඊජිප්තු ශිෂ්ටාචාරය







නයිල් ගංගා නිම්නයේ පහළ කොටසේ මෙම ශිෂ්ටාචාරය දියුණු විය

මෙම ශිෂ්ටාචාරය පාලනය කරන ලද්දේ පාරාවෝ රජ පෙළපතයි

මෙම ශිෂ්ටාචාරය දියුණු වන්නේ ක්‍රි.පූ 3150 දී පමණය

ඔවුන් ලෝකයට දායාද කරන ලද විශිෂ්ටතම දායාදය පිරමිඩයි

පාරාවෝ රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කළේ මෙම පිරමිඩ තුළයි




ඊජිප්තුවේ කයිරෝ නගරයේ පිහිටි ගීසා නම් ස්ථානයේ පිරිමිඩයකි.

# අක්ෂර පද්ධතිය




නොයෙක් භාණ්ඩ හා සතුන්ගේ රූප භාවිතා කොට නිර්මාණය කරන ලද එම අක්ෂර ඊජිප්තු චිත්‍රාක්ෂර වේ




ඊජිප්තුව පාලනය කළ අක්හෙනතන් රජු



අක්හෙනතන් රජුගේ බිසව නෙෆනෙෆවුටෙන් නෙෆටීටි රැජින(ක්‍රි.පූ 1370-1330) මැය කලක් රට පාලනය කර ඇත




රාජකීයෙකු පක්ෂීන් හඹා යන ආකාරය
දැක්වෙන පැරණි ඊජිප්තු සිතුවමක්



මළ සිරුරු කල්තබා ගන්නා මමිකරණ ක්‍රමය ලොවට හඳුන්වා දුන්නේ ඊජිප්තු ශිෂ්ටාචාරයයි




ටූටන් කාමන් රජුගේ මමිය මත තබා තිබූ වෙස් මුහුණ


# ඉන්දු නිම්න ශිෂ්ටාචාරය




# මෙම ශිෂ්ටාචාරය දියුණු වූයේ ඉන්දු ගංගා නිම්නයේය



මෙම ශිෂ්ටාචාරය වර්තමානයේ ඇෆ්ගනිස්තානයටත්,පකිස්ථානයටත්,ඉන්දියාවේ වයඹ කොටසටත් අයත් වේ.




**මොහෙන්දජාරෝ හා හරප්පා එහි පැවති ප්‍රධාන නගර දෙකයි**




ඔවුන් පිළිස්සූ මැටි ගඩොලු භාවිතා කර නිවාස සැදූහ.




එම නිවාස වලට ඉතා දියුණු ජල නළ පද්ධතියක් තිබුණි

# ඔවුන් සැලසුම් කළ නගර වල ජීවත් වූහ



ප්‍රධාන නගර

- මොහෙන්දජාරෝ
- හරප්පා
- ධොලවීර
- කාලිබන්ගන්



ඇස් අඩවන් කර තිබීමෙන් සන්සුන්ව සිටින ඉරියව්වක් පෙන්වයි

මෙම නළලේ ඇති පටිය ඔහු උසස් පුද්ගලයෙකු බව පෙන්වන සංකේතයකි

මෙය පූජකයෙකුගේ මූර්තියක් ලෙස සැලකේ





ඔවුන් ක්‍රමවත් ලෙස ඉදිකරන ලද ජල කාණු ළිං සහ
අපද්‍රව්‍ය බැහැර කරන නළ පද්ධති භාවිතා කළහ.



**මෙහි දැක්වෙන්නේ ප්‍රවාහනයට යොදා ගන්නා ලද කරත්ත අනුරුවකි**






සංකේත

# චීන හා මායා ශිෂ්ටාචාර වලින් ලොවට බිහි වූ දායාද

| චීන ශිෂ්ටාචාරය | මායා ශිෂ්ටාචාරය |
|---|---|
| 1. වෙඩි බෙහෙත් සොයා ගැනීම | 1. රබර් බෝලය සොයා ගැනීම |
| 2. මාලිමාව සොයා ගැනීම | |
| 3. කඩදාසි සොයා ගැනීම | |
| 4. මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම | |


# චීන ශිෂ්ටාචාරය




**වෙඩි බෙහෙත් සොයා ගැනීම**




**මාලිමාව සොයා ගැනීම**



**කඩදාසි සොයා ගැනීම**



**මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම**

# මායා ශිෂ්ටාචාරය



## රබර් බෝලය සොයා ගැනීම

# සම්පූර්ණයි

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 2 | 3. ලෝකයේ පැරණි ශිෂ්ටාචාර -ඇගයීම |

**සැකසුම: මේස මල්හාරි**
**බප/හො/වීදාගම ක.වි**

1). ශිෂ්ටාචාරයක ජීවත් වූ ධනවත් වැසියන් හැඳින්වූයේ කුමන නමින්ද?

.......................................................................................................................

2).ශිෂ්ටාචාරයක මූලික ලක්ෂණ තුනක් දක්වන්න

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

3).පහත සඳහන් දේවල් ලෝකයට දායාද කරන ලද්දේ කුමන ශිෂ්ටාචාරයදැයි ඉදිරියෙන් සඳහන් කරන්න.

වෙඩි බෙහෙත්- ..............................................................................................

මාලිමා යන්ත්‍රය- ..........................................................................................

කඩදාසි- .......................................................................................................

මුද්‍රණ යන්ත්‍රය- ..........................................................................................

රබර් බෝලය- ...............................................................................................

4).මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පැවති ප්‍රදේශය වර්තමානයේ හඳුන්වන්නේ කුමන නමින්ද?

.......................................................................................................................

5).මෙසපොතේමියා යන වචනයෙහි සරල අදහස දක්වන්න

.......................................................................................................................

6).මෙසපොතේමියානු වැසියන් ගොවිතැන් සිදු කළ ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

7).මෙසපොතේමියානු වැසියන්ගේ දේවත්වයට ලක් වූ ස්වභාව ධර්මයේ දේවල් තුනක් සඳහන් කරන්න.

..............................   ..............................   ......................................................

8).මොවුන්ගේ දේව මණ්ඩලයේ ප්‍රධානියා කවුරුන්ද?

..........................................................................................................................................

9) පහත පම් කර ඇති දෙවිවරුන් අධිපතීත්වය දැරූ ස්වභාව ධර්මයේ වස්තූන් සඳහන් කරන්න

එන්කිකී- ........................................................................................................................

එන්ලිලී- ........................................................................................................................

10).ඔවුන් පුද පූජා පැවැත්වූ දේවාල හැඳින්වූයේ කුමන නමින්ද?

..........................................................................................................................................

11).මෙසපොතේමියාවේ උතුරු කොටසේ ජීවත් වූ දක්ෂ වෙළෙන්දන් කවුද?

..........................................................................................................................................

12).තවලම යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

..........................................................................................................................................

13).මෙසපොතේමියානු සමාජය බෙදී තිබූ කොටස් නම් කරන්න

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

14).මෙසපොතේමියානු අක්ෂර හැඳින්වූයේ කුමන නමින් ද?

.......................................................................................................................................

15).ලෝකයේ පැරණිතම වීර සාහිත්‍ය කෘතිය කුමක්ද?

.......................................................................................................................................

16).ලෝකයේ පැරණිතම නීති පොත සකස් කළේ කවුරුන්ද?

.......................................................................................................................................

17).ඉන්දු නිම්න ශිෂ්ටාචාරය දියුණු වූයේ කුමන ගංගාව ආශ්‍රීතවද?

.......................................................................................................................................

18).වර්තමානයේ එම ප්‍රදේශය අයත් වන රටවල් නම් කරන්න

.................................... .................................... ............................................

19).මෙම ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර හතරක් සඳහන් කරන්න

.......................................................................................................................................

.......................................................................................................................................

20).මෙම ශිෂ්ටාචාරයේ සුවිශේෂී ලක්ෂණ දෙකක් සඳහන් කරන්න

.......................................................................................................................................

.......................................................................................................................................

21)ඉන්දු නිම්න ශිෂ්ටාචාරය වර්ධනය වන්නේ කුමන ගංඟාව ආශ්‍රීතවද?

.......................................................................................................................................

22).මෙම ශිෂ්ටාචාරය පාලනය කලේ කුමන රජවරුන්ද?

.......................................................................................................................................

23).ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය කුමක්ද?

.......................................................................................................................................

24).ඊජිප්තු වැසියන් ලොවට දායාද කල විශිෂ්ට නිර්මාණය කුමක්ද?

.......................................................................................................................................

25).ඊජිප්තු අක්ෂර හැඳින්වූයේ කුමන නමින්ද?

.........................................................................................................................

**පින්තූර බලා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න**

26)



1. මෙම මමියෙන් දැක්වෙන්නේ කුමන රජුගේ මුහුණද?.........................................
2. එම රජු ජීවත් වූයේ කුමන කාලයේද?.................................................................
3. මෙම වෙස් මුහුණ නිමවා ඇත්තේ කුමන ද්‍රව්‍යයකින්ද?.......................................
4. මෙය කුමන ශිෂ්ටාචාරයට අයත්ද?......................................................................

27)



1. මෙම මූර්තියෙන් පෙන්වන්නේ කවුරුන්ද?

   .........................................................................................................................
2. ඔබ එසේ හැඳින්වීමට හේතු දෙකක් සඳහන් කරන්න

   .........................................................................................................................

   .........................................................................................................................
3. මෙය හමුවී ඇත්තේ කුමන ශිෂ්ටාචාරයෙන්ද?

   .........................................................................................................................

28)



1.මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද? ..........................................................................

2.මෙය කුමන ශිෂ්ටාචාරයට අයත්ද? ...........................................................................

29)



1.මෙය නිර්මාණය කර ඇති ද්‍රව්‍යය කුමක්ද?...........................................................................

2.මෙයින් නිරූපනය වන්නේ කුමක්ද?...........................................................................

3.ඔවුන් ගොවි උපකරණ නිමවා ඇත්තේ කුමන ද්‍රව්‍යය වලින්ද?

.........................................................................................................................................

4.මෙය කුමන ශිෂ්ටාචාරයට අයත්ද?

.........................................................................................................................................

30)




1.මෙම රූපය කුමක්ද?..............................................................................................

2.මෙය කුමන ශිෂ්ටාචාරයට අයත්ද?..............................................................................

3.මෙම රූපයේ ඉහළ දැක්වෙන සංකේත භාවිතා කරන්නට ඇත්තේ කුමටද?

..........................................................................................................................................

4.මෙම රූපයේ දැක්වෙන සත්වයා නම් කරන්න ...................................................................

31)



1.මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?..........................................................................

2.මෙය පිහිටා ඇත්තේ කුමන නගරයේද?.........................................................................

3.මෙහි තැන්පත් කර ඇත්තේ මොනවාද?..........................................................................

4.මෙය කුමන ශිෂ්ටාචාරයට අයත්ද?..............................................................................

32)



1.මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කවුරුන්ද?.....................................................................

2.මැය කාගේ බිසවක්ද?.............................................................................................

3.ඇය එම ප්‍රදේශය පාලනය කරන ලද්දේ කුමන කාලයේදීද.................................................

4.මෙම රූපය කුමන ශිෂ්ටාචාරයට අයත්ද?.............................................................

33)



1.මෙම අක්ෂර හැඳින්වූයේ කුමන නමින්ද?.........................................................................

2.එම අක්ෂර අයත් වූයේ කුමන ශිෂ්ටාචාරයටද?.............................................................

3.මෙම අක්ෂර ලියා ඇත්තේ කුමකද?.........................................................................

4.මෙම පුවරු වල ලියා ඇති විස්තර මොනවාද?.........................................................

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 2 | 3. ලෝකයේ පැරණි ශිෂ්ටාචාර - පිළිතුරු |

**සැකසුම: මේස මල්හාරි**
**බප/හො/වීදාගම ක.වි**

1).නාගරිකයින්

2).වැඳුම් පිදුම් කිරීමට දේවාල තිබීම,හොඳින් ඉදිකළ මංමාවත්.ගලින් තැනූ නිවෙස්,දිය අගල් හා ප්‍රාකාර තිබීම ,නගරයේ මිනිසුන් අකුරු ලිවීමට දත් පිරිසකි

3).

වෙඩි බෙහෙත්-
මාලිමා යන්ත්‍රය-
කඩදාසි-
මුද්‍රණ යන්ත්‍රය-
} චීන ශිෂ්ටාචාරය

රබර් බෝලය- මායා ශිෂ්ටාචාරය

4).ඉරාකය

5).ගංගා දෙකක් මැදි වන සේ පිහිටි රට

6).ඔවුන් ගොවිතැන් කළ ප්‍රදේශ වල වර්ෂාව හිඟ වූ නිසා ඇළ මාර්ග වලින් අවශ්‍ය ජලය සපයා ගත්හ.සතුන් යොදාගෙන සී සෑවෝය.ඒ සඳහා ලෝහ වලින් තැනූ නඟුල් ද,ගලින් තැනූ උදලු ද භාවිතා කළහ.ධාන්‍ය පළතුරු හා එළවලු වර්ග වගා කරන ලදී

7).වර්ෂාව,සුළඟ,ගංවතුර

8).අනු

9). එන්කිකී- පොලොවට අධිපති

එන්ලිලී-සුළඟට අධිපති

10).සිගුරට්

11).ඇසිරියන්වරු

12) ගොඩබිම හරහා බූරුවන්ගේ පිට මත භාණ්ඩ තබාගෙන වෙළඳාමේ යාම

13).පූජකයින්,ඉහළ පන්ති වල වැසියන් ,පහළ පන්ති වල වැසියන්,වහලුන්

14).කූනාශාක්ෂර

15).ගිලිගමේෂ් විසින් රචිත වීර සාහිතය කෘතිය

16).හමුරාබි

17).ඉන්දු ගංගා නිම්නය

18).ඇෆ්ගනිස්ථානය,පකිස්ථානය හා ඉන්දියාව

19).මොහෙන්දජාරෝ,හරප්පා,ධොලවීර්,කාලිබන්ගන්

20) සැලසුම් සහගත ලෙස නගර ඉදි කර තිබීම,ක්‍රමවත් ලෙස සැලසූ ජල කාණු.

21)නයිල්

22).පාරාවෝ රජ පෙළපත

23).කෘෂිකර්මාන්තය

24).පිරමිඩ

25).ඊජිප්තු චිත්‍රාක්ෂර

26).



1. ටූටන් කාමන් රජු
2. ක්‍රි.පූ 1332-1323
3. රනින්
4. ඊජිප්තු

27).



1. පූජකයෙක්
2. නළලේ ඇති පටිය,ඇස් අඩවන් කර නෙළා තිබීම
3. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

28).



1.පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ඉදි කල ළිඳ

2.ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

29).



1.මැටි

2.සී සෑමේ අවස්ථාවක්

3. ලෝහ,ගල්

4මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

30).




1.මුද්‍රාවක්

2.ඉන්දු නිම්න

3.කිසියම් අදහසක් ප්‍රකාශ කිරීමට

4.රයිනෝසිරස්

31).



1.පිරමිඩයක්

2.ඊජිප්තුවේ කයිරෝ නගරයේ

3.පාරාවෝ රජුන්ගේ හා බිසෝවරුන්ගේ මෘත දේහ

4.ඊජිප්තු ශිෂ්ටාචාරය

32).



1.නෙෆනෙෆවුටෙන් නෙෆර්ටිටි රැජින

2.අක්හෙනතන් රජුගේ බිසව

3.ක්‍රි.පූ 1370-1330

4.ඊජිප්තු ශිෂ්ටාචාරය

33).



1.කූනාක්ෂර

2.මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

3.මැටි පුවරු

4.වෙළඳාම් පිළිබඳ